# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 2 ශ්‍රේණිය - පරිසරය( දෙසැම්බර්- 1සතිය)

## 15 තේමාව - වටපිටාවේ වෙනස් තැන්.

දුවේ පුතේ අද අපි වැඩිහිටියන්ගේ ද උදවු ලබාගෙන ලස්සන ආදේශන භාණ්ඩ කිහිපයක් හදමු.

- ටොනික් පියන් මූඩි හොඳින් තලා මැදින් හිල් කර කම්බියක දමා සකස් කරගත් වළල්ලක හැඩය ඇති භාණ්ඩයක්.
- x-ray card එකක් ලී රාමුවකට සවිකර තනාගන්නා බෙරය හා වාදනයට කඩිප්පුවක්.
- ටින් දෙකක් එකට එක් කර සකස් කර සාදාගත් ආදේශන තම්මැට්ටමක් හා වාදනයට කඩිප්පුවක්.
- හොඳින් පිරිසිදු කරගත් එක සමාන ප්‍රමාණයේ පොල්කටු දෙකක්.
- ඇලුමිනියම් හැඳි දෙකක්.
- රබර් ඇට/ ඔලිඳ ඇට/ මදටිය ඇට (එක් වර්ගයක්) දැමූ ටින් එකක්.
- පොල්ගෙඩියක මදය ඉවත් කර එක හිලක් සාදා එය තුළට ඇට දමා හිල මතට කෝටුවක් සවි කර සාදාගත් භාණ්ඩයක්.
- එක සමාන ලී පොලු දෙකක්.

❖ දුවේ පුතේ දැන් අපි පරිසරයේ ඇසෙන ශබ්දවලට හොඳින් සවන් දෙමු.(වැස්ස, සුළඟ, දුම්රිය ආදී)

❖ චූටි දුවේ පුතේ දැන් අපි ගෙදර අයත් එකතු කරගෙන, ඔයා හදපු අදේශන භාණ්ඩවලින් විවිධ ශබ්ද වාදනය කරමු. සතුටු වෙමු.



E nanapiyasa 2 ශ්‍රේණිය පරිසරය -15 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.